LIBRARY
SRI LANKA

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික සමීක්ෂණයට අනුව 1978 දී රජයේ දෙපාර්තමේන්තුවල සේවා නියුක්තියෙහි විශාල වැඩිවීමක් පෙන්නුම් කරයි. එනම් රාජ්‍ය දෙපාර්තමේන්තුවල සේවා නියුක්ති සංඛ්‍යාව 23,438 කින් හෙවත් සියයට 5.5 කින් වැඩිවිය. අළුත් රැකීරක්ෂා ඇතිවූ ප්‍රධාන මාර්ග වනුයේ ගුරු වෘත්තිය (6%), සුළු සේවක අංශ (6%) සහ සහායක සේවක (5%) යන අංශයන්ය.

අර්ධ රාජ්‍ය ආයතනයන් හි (එනම් ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය සංස්ථා) සේවක සංඛ්‍යාව 35,439 කින් නැතහොත් සියයට 6 කින් වැඩිවිය. මෙයින් සියයට 73 ක් සුළු සේවක ශ්‍රේණි සඳහා වූ අතර සියයට 25 ක් සහායක ශ්‍රේණිවල විය.

ප්‍රමාණවත් දත්ත නොමැති කමින් අර්ථසාධක අරමුදලේ ක්‍රියාකාරි ගිණුම් සංඛ්‍යාව ආයතනගත පෞද්ගලික අංශයේ සේවා නියුක්තියේ වාර්ෂික වෙනස්වීම මැනීමට ප්‍රයෝජනයට ගන්නා ලදි. 1977 දී ක්‍රියාකාරි ගිණුම් සංඛ්‍යාව 1976 දී පෙන්නුම්කල 34,403 ක පහත වැටීමට ප්‍රතිවිරුද්ධ වශයෙන් 73,309 කින් වැඩිවිය. මෙයට වැවිලි අංශයේ 48,676 (20%) ක් ද, නිෂ්පාදන අංශයේ 13,132 (9%) ක් ද සහ සේවා අංශයේ 6,907 (10%) ක වර්ධනයක් ද ඇතුලත් විය. 1978 දී ගිණුම් සංඛ්‍යාව 77,292 කින් වැඩිවූ අතර එය 1977 ට වඩා සියයට 9 ක වැඩිවීමකි. අරමුදලට දයක වන අර්ධ රාජ්‍ය ආයතනයන් හි ඇති වූ අළුත් රැකියා අත්හල විට සංවිධානාත්මක පෞද්ගලික අංශයේ ඇතිවූ අළුත් රැකියා සංඛ්‍යාව 1978 දී 43,369 ක් වියහැකි බව තක්සේරු කළ හැකිය. 1977 දී මෙම සංඛ්‍යාව 43,015 ක් විය.

ඉහත දත්ත අනුව රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රාජ්‍ය ආයතන හා සංවිධානාත්මක පෞද්ගලික අංශයේ රැකීරක්ෂා සම්පාදනය 1977 දී 40,000 ක් වූ අතර, එය 1978 දී 1,02,000 ක් පමණ වූ බව පෙනේ. කෙසේ වෙතත් මෙම සංඛ්‍යාවට මෙම අංශවලින් විශ්‍රාම ගිය හා වෙනත් හේතූන් මත රැකියා හැර ගිය අය වෙනුවෙන් පත්කරන ලද අය ඇතුළත් නොවේ. එසේම දේශීය කෘෂිකර්ම අංශයෙන් හා ආයතනික නොවූ පෞද්ගලික අංශයේ රැකීරක්ෂා ද ඇතුළත් නොවේ. එම අංශ දෙකේ රැකියා ඇස්තමේන්තුකොට නොමැත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් මෑතකදී පවත්වන ලද සමීක්ෂණයකට අනුව 1978 වර්ෂ අවසානයේ දී ශ්‍රී ලාංකිකයන් 20,000 ක් පමණ මැද පෙරදිග රැකියාවල යෙදී සිටි බව හෙළිවී ඇත. පුහුණු මෙන්ම උගත් අයගේ මෙම සංක්‍රමණයෙන් පැන නැගිය හැකි ප්‍රශ්ණ පසුගිය වාර්ෂික වාර්තාවෙන් ද පෙන්වා දෙන ලදී. රාජ්‍ය අංශය මගින් නව තාක්ෂණිකයන් පුහුණු කිරීමට දරණ ලද උත්සාහයන් ප්‍රමාණවත් නොවන බව පෙනේ. ප්‍රමාණවත් දිරිදීම් සහිතව පෞද්ගලික අංශයට මෙය වඩා සාර්ථකව කළහැකි බව පෙනේ.

සේවා වියුක්ති සමහර කොටස්වලට රුපියල් 50/- ක මාසික දීමනාවක් දීමට 1978 අයවැය කථාවෙන් ප්‍රකාශිත අදයම් ආධාරදීමේ වැඩ පිළිවෙල මෙම වසරේ අවසන් භාගයේ දී ක්‍රියාත්මක විය. මෙම ආධාර ක්‍රමය යටතේ ආධාර ලැබූවන්ගේ සංඛ්‍යාව වර්ෂ අවසානයේ දී 3,72,684 ක් වූ අතර, මේ සඳහා රුපියල් දශලක්ෂ 114 ක මුදලක් වැය විය. පසුගිය දශක කීපය තුල රැකියා පුරප්පාඩු පිරවීම සඳහා පැවැති රැකීරක්ෂා කාර්යාල වෙනුවට 1978 වර්ෂයේ දී රැකීරක්ෂා බැංකු ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම නව වැඩ පිළිවෙලේ ප්‍රධාන පරමාර්ථය වන්නේ ආරක්ෂක සේවාවන්, රාජ්‍ය අංශයේ හා පළාත් පාලන අංශයේ මාණ්ඩලික නොවන ශ්‍රේණි සඳහා පුරප්පාඩු පිරවීම සම්බන්ධීකරණය කිරීමයි.

## විදේශීය වෙළෙඳාම

ශ්‍රී ලංකාවේ වෙළෙඳ තුලනය හෙවත් ශේෂය (රේගු සංඛ්‍යා අනුව) 1978 දී රුපියල් දශලක්ෂ 1,457 (වි. හැ. අ. දශලක්ෂ 98) හිඟයක් දක්වූයේ අවුරුදු දෙකක පැවති අතිරික්ත තත්ත්වයකින් පසුවය. කිසියම් කාලපමාවකින් පසු ලේඛනගත වන සමහර රජයේ ආයතනවල ආනයන සහ අපනයන සඳහා රේගු සංඛ්‍යා ගැලපූවිට වෙළෙඳ තුලනය රුපියල් දශලක්ෂ 2,173 දක්වා වැඩිවෙයි.

## 1·8 වැනි සංඛ්‍යා සටහන
## 1976-1978 වෙළෙඳ තුලනය

රුපියල් දශලක්ෂ වලිනි.
විශේෂ හැරගැනුම් අයිතිවාසිකම් දශලක්ෂ වලින් වරහන් තුළ ඇත.

| වර්ෂය | ආනයන | | අපනයන | | වෙළෙඳ තුලනය | |
|---|---|---|---|---|---|---|
| | රේගු සංඛ්‍යා | ගලපන ලද සංඛ්‍යා | රේගු සංඛ්‍යා | ගලපන ලද සංඛ්‍යා | රේගු සංඛ්‍යා | ගලපන ලද සංඛ්‍යා |
| 1976 .. | 4,645<br>(477) | 4,946 | 4,815<br>(495) | 4,840 | + 170<br>(+ 18) | − 106 |
| 1977 .. | 6,007<br>(630) | 6,298 | 6,638<br>(659) | 6,570 | + 631<br>(+ 29) | + 271 |
| 1978 .. | 14,663<br>(774) | 15,366 | 13,206<br>(676) | 13,193 | − 1,457<br>(− 98) | − 2,173 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව.
ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව.
ශ්‍රී ලංකා පොහොර සංස්ථාව.
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව.
රාජ්‍ය මැණික් සංස්ථාව.

1978 සහ ඊට පෙර වර්ෂවල රේගු වෙළෙඳ සංඛ්‍යා අර්ථවත් ලෙස සැසඳිය නොහැකිය. ඊට හේතුව ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වන සංඛ්‍යාවල 1977 සිට රුපියලේ අගයෙහි හටගත් සැලකිය යුතු වෙනස්කම් අන්තර්ගත වීමයි. එම නිසා සැසඳීමේ පහසුව පිණිස වෙළෙඳ සංඛ්‍යා විග්‍රහය, සාපේක්ෂ වශයෙන් වඩා ස්ථාවර ගිණුම් ඒකකයක් වූ විශේෂ හැරගැනීම් අයිතිවාසිකම් (වි හැ.අ.) වලින් කරනු ඇත.

1978 වෙළෙඳ අවාසිය හට ගත්තේ ආනයන වියදමෙහි වූ සියයට 23 ක වැඩිවීමත් අපනයන ඉපයීම්වල සියයට 3 කින් පමණ වූ සුළු වැඩිවීමත් නිසාය. ආනයන වි.හැ.අ. දශලක්ෂ 144 කින් වැඩිවූ අතර, අපනයන වි.හැ.අ දශලක්ෂ 17 කින් වැඩි විය.

ආනයන වැඩිවීම 1977 අවසාන භාගයේදී කරන ලද ආනයන පාලනය නිදහස් කිරීමේ ඍජු ප්‍රතිවිපාකයක් විය. ආනයන පරිමා දර්ශකයෙන් (1967—100) දක්වෙන අන්දමට ආනයන පරිමාව 1960 න් පසු වැඩිම මට්ටම දක්වා, සියයට 27 කින් වැඩි විය. අපනයන වර්ධනය සාපේක්ෂ වශයෙන් අඩුවීමට මූලික හේතුව වූයේ ලංකාවේ ප්‍රධාන අපනයන භාණ්ඩය වූ තේවල ලෝක වෙළෙඳ පළ මිල 1977 තිබූ ඉහළ මට්ටමෙන් පහළට වැටීමයි.

## 1·9 වැනි සංඛ්‍යා සටහන
## 1969 – 1978 විදේශීය වෙළෙඳාම

| කාල-ඡේදය | රුපියල් දශලක්ෂ | | | දර්ශක අංකය (1967 = 100) | | | | වෙළෙඳ අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | පරිමාව | | මිල | | |
| | අපනයන1 නැ.වි.ස. | ආනයන මි.ර.ගැ. | වෙළෙඳ ශේෂය | සියලුම අපනයන | සියලුම ආනයන | සියලුම අපනයන | සියලුම ආනයන | |
| 1967 | 1,690 | 1,738 | − 48 | 100 | 100 | 100 | 100 | 100 |
| 1968 | 2,035 | 2,173 | − 138 | 103 | 101 | 117 | 126 | 93 |
| 1969 | 1,916 | 2,543 | − 627 | 98 | 108 | 117 | 134 | 88 |
| 1970 | 2,033 | 2,313 | − 280 | 102 | 102 | 118 | 140 | 84 |
| 1971 | 1,947 | 1,986 | − 39 | 99 | 90 | 117 | 150 | 78 |
| 1972 | 2,009 | 2,064 | − 55 | 97 | 88 | 118 | 157 | 75 |
| 1973 | 2,617 | 2,715 | − 98 | 98 | 79 | 137 | 209 | 65 |
| 1974 | 3,471 | 4,554 | −1,082 | 85 | 56 | 217 | 370 | 58 |
| 1975 | 3,933 | 5,251 | −1,318 | 102 | 69 | 199 | 433 | 46 |
| 1976 | 4,815 | 4,645 | + 170 | 97 | 75 | 239 | 383 | 62 |
| 1977 | 6,638 | 6,007 | + 631 | 89 | 97 | 382 | 471 | 81 |
| 1978 | 13,206 | 14,662 | −1,456 | 95 | 132 | 698 | 877 | 80 |

මූලයයන්: ශ්‍රී ලංකා රේගුව.
ශ්‍රී ලංකා මහ බැංකුව.

1. ප්‍රති අපනයන ඇතුළත්ය.

1977 සිදු කරන ලද ප්‍රතිසංස්කරණ අපනයන වලට වඩා ආනයන පිළිබඳව අධිකවූත් ක්ෂණිකවූත් බලපෑම් ඇති කළේය. අවුරුදු ගණනාවක පැවති බලපත්‍ර ක්‍රම හා පාලන ලිහිල්වූ පසු ඉහළ ආනයන පිරිවැය මධ්‍යයේ වුවද අධික ආනයන වැඩිවීමක් සාමාන්‍යයෙන් බලාපොරොත්තු විය හැකිය. කෙසේවුවද, අපනයන සම්බන්ධයෙන් එබඳු වැඩිවීමක් බලාපොරොත්තු වියහැක්කේ මධ්‍යම හා දීර්ඝ කාලීන වශයෙන් පමණකි; සැපයුම කෙටි කාලයේදී අනම්‍යවීම ඊට හේතුවයි. විනිමය අනුපාතය අවප්‍රමාණය කිරීම මගින් ලැබුණ සානුබල නිසා අපනයන වර්ධනයක් සාමාන්‍යයෙන් බලාපොරොත්තු වියහැක්කේ කිසියම් කාලච්ඡේදයකට පසුවය. විශේෂයෙන්ම, මෙම වෙනස් කිරීමට පෙර ප්‍රධාන සම්ප්‍රදායික අපනයන භාණ්ඩ තුනට ඉහළ විනිමය අනුපාත යන් නො ලැබුණ බව මෙහිදී සැලකිය යුතුය. කෙසේ වුවත්, මෙම ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් තේ, රබර් හා පොල් නිෂ්පාදකයන්ට ලැබිය යුතුව තිබූ ලාබයෙන් වැඩි කොටසක් රජය විසින් අත්කර ගන්නා ලදී. තේ, රබර් සහ පොල් සඳහා වූ අපනයන තීරු බද්ද වැඩිකළ බැවින් නිෂ්පාදන පිරිවැය වැඩිවන අවධියකදී අපනයන වලින් නිෂ්පාදකයින්ට ලැබෙන කොටසෙහි අඩුවීමක් සිදුවිය. මේ නිසා, පසුගිය වර්ෂයේ ද සඳහන් කළ පරිදි මෙම ප්‍රධාන කර්මාන්ත සඳහා ඇති සානුබල පිළිබඳ ප්‍රශ්නය අතිශය වැදගත් ලෙස සලකා බැලිය යුතුව ඇත. ආර්ථිකයේ මෙකී ප්‍රධාන අංශයන්හි ශක්තිමත් පැවැත්ම සහතික කිරීම සඳහා මෙම බදු පිළිබඳ නිරන්තර විමර්ශනයන් අවශ්‍ය වෙයි.

**අපනයන**

ඉහත සඳහන් කළ පරිදි 1978 දී අපනයන ඉපැයීම් වැඩිවූයේ සියයට 3 කින් පමණි. 1978 වර්ෂයේ මෙම මඳ ප්‍රගතිය 1977 වර්ෂයේ වූ සියයට 33 ක වර්ධන වේගයෙන් ඉවත්ව යාමක් විය. ප්‍රධාන අපනයන ඉපැයීම් වලින් තේ, මැණික් සහ ඛණිජ තෙල් නිෂ්පාදන වල වටිනාකම් අඩු වූ අතර රබර් සහ පොල් නිෂ්පාදන වලින් ලද ඉපයීම් වැඩි විය.

**1·10 වැනි සංඛ්‍යා සටහන**

**1976 - 1978 අපනයන සංයුතිය**

| වර්ගය | වටිනාකම රුපියල් දශ ලක්ෂ වරහන් තුල වි. හැ. අ. දශලක්ෂ වලින් | | | මුළු අපනයනවල ප්‍රතිශතය | | |
|---|---|---|---|---|---|---|
| | 1976 | 1977 | 1978 | 1976 | 1977 | 1978 |
| තේ .. .. | 2100 (216) | 3503 (355) | 6401 (327) | 44 | 53 | 48 |
| රබර් .. .. | 890 (91) | 931 (93) | 2021 (103) | 18 | 14 | 15 |
| පොල් .. .. | 382 (39) | 335 (32) | 972 (50) | 8 | 5 | 8 |
| සුළු කෘෂි භෝග* .. .. | 231 (24) | 378 (38) | 658 (33) | 5 | 6 | 5 |
| මැණික් .. .. | 261 (27) | 298 (30) | 531 (27) | 5 | 4 | 4 |
| කර්මාන්ත අපනයන .. .. | 782 (80) | 919 (86) | 1891 (97) | 16 | 14 | 14 |
| වෙනත් අපනයන .. .. | 170 (18) | 275 (26) | 733 (38) | 4 | 4 | 6 |
| මුළු අපනයන .. .. | 4815 (495) | 6638 (659) | 13206 (676) | 100 | 100 | 100 |

* තෝරාගත් භෝග වර්ග

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

1978 දී තේ අපනයන වටිනාකම සියයට 8 කින් අඩුවූයේ තේ කිලෝවක මිළ 1977 දී වි. හැ. අ. 1.81 සිට 1978 දී වි. හැ. අ. 1.70 දක්වා අඩු වූ නිසාය. තේ නිෂ්පාදනයේ අඩුවක් වුවද අපනයන පරිමාව කිලෝ දශලක්ෂ 7කින් වැඩිවිය. ජාත්‍යන්තර තේ මිල 1977 දීවූ ඉහළ මට්ටමෙන් පහළට වැටුනද, එය පසුගිය වර්ෂ කීපය තුළදීම වැඩිවෙමින් තිබූ අතර, 1978 තිබූ මට්ටමද 1976 වඩා සැහෙන පරිදි ඉහළින් තිබුණි. එම නිසා පසුගිය දශකය තුළ ප්‍රධාන තේ නිෂ්පාදක රටවල් අතරින් ලංකාවේ පමණක් නිෂ්පාදනය පහළ වැටීම වැදගත් ලෙස සලකා බැලිය යුතු කරුණක් වේ. ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකාවට අවුරුදු 14 කට පෙර, 1965 දී පැවති ඉහළ නිෂ්පාදන මට්ටම ඉක්මවීමට තවම නොහැකිවිය. රෙගු බදු අනිකුත් බදු හා ගාස්තු ආදිය දැනට අපනයන මිළෙන් සියයට පනහක් පමණ වෙයි. මෙය නිෂ්පාදනය වැඩිකිරීමට විශාල බාධකයක්ව පවතින බව පෙනේ.

මේ අතර, රබර් අපනයන වටිනාකම සැලකියයුතු මට්ටමකින් වැඩි වූයේ මූලික වශයෙන් සියයට 14 ක් වූ මිළ වැඩිවීම හේතුකොට ගෙනය. රබර් අපනයන ප්‍රමාණය වැඩි වූයේ සුළු වශයෙන් පමණි. පොල් නිෂ්පාදිත අපනයන ඉපැයීම් වැඩිවීමට හේතුවූයේ අපනයන කළ පොල් ප්‍රමාණය වැඩිවීමයි. වැඩියෙන් අපනයනය කිරීමට හැකිවූයේ 1977 වූ අඩුම මට්ටමේ සිට නිෂ්පාදනය හොඳ අතට හැරීමෙනි. එසේ වුවද, පොල් නිෂ්පාදන වල අපනයන මිල 1978 දී පොල් ගෙඩියකට වි. හැ. ඇ 0.09 දක්වා, සියයට 18 කින් අඩුවිය.

1978 දී මැණික් සහ ඛණිජ තෙල් නිෂ්පාදන වලින් වූ ඉපැයීම් ද අඩුවිය. දේශීය පරිභෝජනය වැඩිවීම නිසා ඛණිජ තෙල් නිෂ්පාදන අපනයන අඩුවී ඇති බව පෙනේ. කාර්මික අපනයන (ඛණිජ තෙල් නිෂ්පාදන හා මැණික් හැර) වි.හැ.අ.දශලක්ෂ 49 දක්වා සියයට 68 කින් පමණ වැඩි විය, මෙය වැඩිවීම ප්‍රධාන වශයෙන් වූයේ මැසූ ඇඳුම්, ග්ලිසරින්, කෑමට ගන්නා තෙල්, ඉස්සන් සහ බෙල්ලෝ, පිහන් බඩු, යන්ත්‍රෝපකරණ, යාන්ත්‍රික උපකරණ මිනිරන් සහ ඉල්මනයිට් යන අංශයන්හිය.

තෝරාගත් සුළු කෘෂිකාර්මික භෝග අපනයන 1977 දී වි.හැ.අ දශලක්ෂ 38 සිට 1978 දී වි.හැ.අ. දශලක්ෂ 34 දක්වා අඩු විය. මෙම ලැයිස්තුවේ බොහෝ භෝගයන්හි මිළ යාන්තමින් වැඩි වූ අතර බොහෝ ද්‍රව්‍යවල අපනයන ප්‍රමාණයන් පසුගිය වර්ෂ ගණනාවක් තිස්සේම පහළ වැටුණි. එසේ වුවද, මෙම සම්ප්‍රදායානුගත ලැයිස්තුවට අඩංගු නොවන කෝපි සහ තල සම්බන්ධව සලකා බැලුවහොත්, ඒවායේ පසුගිය වර්ෂයේ මට්ටමට පමණ වැඩි වී තිබේ.

ආනයන

ආනයන ලිහිල් කිරීමෙන් අනතුරුව පැනනැඟුණු ආනයන රටාව දිරිගන්වන සුළු එකක් විය. ආර්ථිකයේ වර්ධන වේගයේ වැඩිවීම පිළිබිඹු කරමින් ආයෝජන භාණ්ඩ අපනයනයන්ගේ තියුණු වැඩිවීමක් විය. ආනයන පරිමා දර්ශකයට (1967 - 100) අනුව ප්‍රාග්ධන භාණ්ඩ ආනයන පරිමාව මෙතෙක් පැවති ඉහළම දර්ශකය බවට පත් වෙමින් සියයට 63 පමණ වැඩි ප්‍රමාණයකින් ඉහළ ගියේය. ප්‍රාග්ධන භාණ්ඩවල ආයෝජනය දිඝකාලීන කරුණුමත රඳන බැවින් එම භාණ්ඩ ආනයනය වැඩිවීම ආර්ථිකයේ අනාගත ඉමහත් වර්ධන වේගය පිළිබඳ දර්ශකයකි. අන්තර් භාණ්ඩ ආනයන පරිමාව සියයට 10 කින් වැඩි වී යැයි පෙනේ. අනිකුත් ආනයන වැඩිවීම් කැපියන පරිදි සහල් ආනයන අඩුවීම නිසා පරිභෝජන භාණ්ඩ ආනයන පහත වැටුණි. විශේෂ හැරගැනුම් අයිතීන් මඟින් දක්වනු ලබන වෙළෙඳ දත්ත විශ්ලේෂණයට අනුව 1978 දී මුළු ආනයන වලින් ආයෝජන භාණ්ඩවල පංගුව 1977 වූ සියයට 12 සිට සියයට 23 දක්වා ඉහළ ගියේය. පරිභෝජන හා අන්තර් භාණ්ඩවල එකිනෙක පංගු සියයට 44 පමණ සිට සියයට 38 දක්වා පහළ ගියේය. පරිභෝජන භාණ්ඩවල පංගුව පහත වැටීමට බල පෑ ප්‍රධාන හේතුව වූයේ සියයට 63 කින් පමණ පහත වැටී සහල් ආනයන අඩුවීමයි.

## 1·11 වැනි සංඛ්‍යා සටහන

## 1976 – 1978 ආනයන වියදම්

| වර්ගය | වටිනාකම වි. හැ. අ. දශලක්ෂ | | | වටිනාකම රුපියල් දශලක්ෂ | | | මුළු ආනයනවල ප්‍රතිශතයක් ලෙස | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1976 | 1977 | 1978* | 1976 | 1977 | 1978* | 1976 | 1977 | 1978 |
| **1· පාරිභෝගික භාණ්ඩ** | **174** | **270** | **287** | **1,689** | **2,534** | **5,593** | **36** | **42** | **38** |
| 1·1 ආහාර සහ පානවර්ග | 153 | 224 | 210 | 1,491 | 2,181 | 4,103 | 32 | 36 | 28 |
| (i) සහල් | 62 | 94 | 35 | 602 | 917 | 689 | 13 | 15 | 8 |
| (ii) පිටි | 70 | 96 | 117 | 683 | 925 | 2,274 | 15 | 15 | 16 |
| (iii) සීනි | 7 | 19 | 26 | 64 | 197 | 514 | 1 | 3 | 4 |
| 1·2 රෙදිපිළි සහ ඇඳුම් පැළඳුම් | 5 | 15 | 27 | 49 | 150 | 531 | 1 | 3 | 4 |
| 1·3 වෙනත් | 16 | 31 | 50 | 149 | 203 | 959 | | | |
| **2· අන්තර් භාණ්ඩ** | **232** | **262** | **287** | **2,259** | **2,648** | **5,591** | **49** | **44** | **38** |
| 2·1 ඛණිජ තෙල් | 120 | 141 | 123 | 1,164 | 1,441 | 2,402 | 25 | 24 | 16 |
| 2·2 පොහොර | 10 | 6 | 13 | 99 | 51 | 252 | 2 | 1 | 2 |
| 2·3 රසායන ද්‍රව්‍ය | 9 | 100 | 128 | 906 | 1,036 | 2,491 | | | |
| **3· ආයෝජන භාණ්ඩ** | **66** | **73** | **173** | **641** | **746** | 3,367 | **14** | 12 | **23** |
| 3·1 යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 37 | 33 | 95 | 364 | 286 | 1,845 | 8 | 5 | 13 |
| 3·2 ප්‍රවාහන උපකරණ | 18 | 24 | 51 | 175 | 232 | 988 | 4 | 4 | 7 |
| 3·3 ගොඩනැගිලි ද්‍රව්‍ය | 11 | 9 | 8 | 104 | 129 | 150 | 2 | 2 | 1 |
| **4· වර්ග නොකරන ලද** | **6** | **251** | **29†** | **54** | **79** | **110** | **1** | **1** | **1** |
| **· මුළු ගණන** | **477** | **630** | **774** | **4,645** | **6,007** | **14,662** | **100** | **100** | **100** |

මූලය: ශ්‍රී ලංකා රේගුව.

* තාවකාලිකය.

† 1977 නොවැම්බර් මස 15 දිනට පසුව කරන ලද ගනුදෙනු පිළිබඳව ඉන් පෙර පැවති අනුපාත යොද ගනිමින් කරන ලද ගැලපීම් ඇතුළත්ය.

වර්ෂ ගණනාවක සපුරාලිය නොහැකිව රැගිභූත වූ ඉල්ලුම හමුවේ ආයෝජන භාණ්ඩ කාණ්ඩයට අයත්වන යන්ත්‍රෝපකරණ සහ ගමනාගමන උපකරණ ආනයන 1977 වර්ෂයේදී මෙන් දෙගුණයකටත් වඩා වැඩිවිය. උදහරණයක් වශයෙන් ලොරි සහ වෑන් රථ ලියාපදිංචි කිරීම 1978 දී සිව් ගුණයකින් වඩා වැඩිවිය.

1978 පරිභෝජන භාණ්ඩ සඳහා වියදම වැඩිවූයේ සියයට 6 ක පමණ ප්‍රමාණයකිනි. 1978 දී සහල් හැර සියළුම අතුරු පරිභෝජන භාණ්ඩ වර්ගයන්හි වැඩිවීම් සටහන් විය. කිරි නිෂ්පාදිත, රෙදිපිළි, මෝටර් කාර් සහ විවිධ ආහාර නිෂ්පාදිත ආනයනයන් සැලකියයුතු පමණින් වැඩිවි ය.

අන්තර් භාණ්ඩ අපනයනය අතරින් රසායනික ද්‍රව්‍ය, පොහොර, කඩදාසි සහ ඝන කඩදාසි සඳහා වියදම ඉහළ ගිය අතර පරිමාව අඩුවීමේ හේතුවෙන් ඛණිජ තෙල් නිෂ්පාදිත සහ තිරිඟු සඳහා වියදම පහත වැටුනි.

**වෙළෙඳ ප්‍රතිපත්තිය**

1978 දී වෙළෙඳ ප්‍රතිපත්තිය යොමුකර තිබුණේ අපනයන වර්ධනය, බලපත්‍ර ක්‍රම සහ පාලන ක්‍රියා පිළිවෙලවල් තවදුරටත් ඉවත් කිරීමසහ තීරුබදු ව්‍යුහයේ ප්‍රතිසංස්කරණ කිරීම කෙරෙහිය.

ආනයන බදු අඛණ්ඩ විමර්ශනයකට භාජනව තිබූ අතර, වර්ෂය තුළදී බදු පිළිබඳ ඇතැම් වෙනස්කම් සිදුවිය. සැපයුම් ඌනතා සහිත භාණ්ඩයන්, අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍යයන් සහ අන්තර් සහ ආයෝජන භාණ්ඩවලින් සමන්විත භාණ්ඩ කීපයක් සඳහා ආනයන බදු අඩුකරන ලදී. සුඛෝපභෝගී පරිභෝජන භාණ්ඩ සඳහා වූ බදු, සමහර අවස්ථා වලදී වැලකීමේ මට්ටමක් දක්වා වැඩිකරන ලදී. උදහරණයක් වශයෙන් සුවඳ විලවුන්, බුමුතුරුණු සහ සිගරට් වැනි භාණ්ඩවල බදු, ජනවාරි වලදී සියයට 500 දක්වා වැඩිකරන ලදී. උකුකිරි, ළදරු හා දුබලයන් සඳහා කිරිපිටි, ශීතකළ මස්, විස්කෝතු එළවළු මාංශජනක සහ යීස්ට් වැනි සමහර පාරිභෝගික භාණ්ඩ සඳහා බදු අඩු කිරීම විය. කටුකම්බි, යකඩ හා වානේ භාණ්ඩ, පොහොර සහ කෘමිනාශක වැනි අන්තර් භාණ්ඩ කීපයක් සඳහා මෙන්ම බර ඩීසල් වාහන සඳහා එන්ජින් හා වැසි, වහල සෙවිලි කිරීමේ උළු සහ ඇසබැස්ටස් තහඩු වැනි ආයෝජන භාණ්ඩ සඳහා වූ බදු අඩු කරන ලදී.

අපනයන අතරින් ක්ෂණික තේ, කුරුඳු, කර්දමුංගු හා පැඟිරිතෙල් සහ කොකෝවා සඳහා වූ බදු අර්ධයක් දක්වා අඩුකරන ලද අතර ගම්මිරිස්, කරාබු, කෝපි සහ සාදික්කා අපනයන බදුවලින් සම්පූර්ණයෙන්ම නිදහස් කරන ලදී. කුට්ටි රබර් සඳහා වූ බදු අනිකුත් රබර් අපනයන සමග සබඳතාවය නැවතත් පිහිටුවන අයුරින් වැඩිකරන ලදී.

1977 නො. 1 දරන විශේෂ ආනයන බලපත්‍රයේ පළමුවැනි ලේඛනය තවදුරටත් වෙනස් කරන ලදී. පූර්ව බලපත්‍රයන්ට භාජනවූ ලැයිස්තුවෙන් ප්‍රධාන වශයෙන් කොත්තමල්ලි, සීනි පොහොර, ගිනිපෙට්ටි, කෘත්‍රිම රේසින් සහ ප්ලාස්ටික් භාණ්ඩ, තේ පෙට්ටි සඳහා තුනී ලෑලි, බොක්ස් බෝර්ඩ්, ඇතැම් මූල ලෝහ සහ අන්තර් දහන ඇන්ජින් වැනි අයිතමයන් කීපයක් ඉවත් කරන ලදී.

සම්ප්‍රදායානුකූල නොවන අපනයන බොහොමයක් අපනයන පාලනයෙන් ඉවත්කරන ලදී. පූර්ව අපනයන බලපත්‍ර සඳහා අවශ්‍යතාවය අයිතම 21 ක් හැර අනිත් සියල්ලෙන්ම ඉවත් කෙරුණි. මෙම අයිතමයන් බලපත්‍ර යටතේ පවත්නේ නැවත ප්‍රතිපාදනය කළ නොහැකි සම්පත් සංරක්ෂණය කිරීමත්, අත්‍යාවශ්‍ය පාරිභෝගික අවශ්‍යතාවයන් සඳහා දේශීය සහනාධාර සැපයීමත්, පරිසර ආරක්ෂාව සඳහා රටේ සත්ව සහ පැලෑටි සංරක්ෂණය කිරීම උදෙසාත්ය.

අපනයන වර්ධනය සඳහා වර්ෂය තුළදී විවිධ ක්‍රියාමාර්ගයන් හඳුන්වාදී ඇත. කෘෂිකාර්මික භෝග නැවත වගාකිරීම සහ අලුතින් වගාකිරීම සඳහා වූ සහනාධාර වැඩි වන සේ වෙනස් කරන ලදී. 1978 දී විදේශ චාරිකා සඳහා විදේශ විනිමය ප්‍රධානයන් වැඩිකිරීමට යෙදුනි. අපනයනයන්ට නැඹුරුවූ විදේශීය ආයෝජන ඇදගැනීම සඳහා 'අපනයන සංවර්ධන ප්‍රදේශ' පිහිටුවීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම පිහිටුවන ලදී. 1978 වර්ෂය තුළදී එහි කර්මාන්ත පිහිටුවීම සඳහා අනුමතීන් 52 ක් ප්‍රදානය කිරීමට යෙදුනි.

අපනයන වර්ධනය සඳහා තවත් වැදගත් ක්‍රියාමාර්ගයක් වූයේ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වයට පත්ව තිබූ (1979 දී හඳුන්වා දුන්) අපනයන ණය සහතික කිරීමේ සංස්ථාව පිහිටුවීමයි. මෙම සංස්ථාව අපනයන කරුවන්ට ලිහිල් පදනමක් මත බැංකු ණය ලබාගැනීමට ආධාර වන අතර විදේශීය ගැනුම්කරුවන් විසින් කල් පසුවී කරන ගෙවීම් හෝ නොගෙවීම් වල අවදානමෙන් ආරක්ෂාව සඳහා මාර්ගයක්ද සපයයි. අපනයන සංවර්ධනය පිළිබඳ ඇමතිවරුන්ගේ සභාවක් සහ අපනයන සංවර්ධන මණ්ඩලයක් පිහිටුවීම සඳහාද නීතිපැනවීමේ කටයුතු සකස්කරමින් පැවතුනි. අපනයන වර්ධනය සඳහා අවශ්‍ය බලතල මේ මණ්ඩලය වෙත පැවරෙනු ඇත.

## ගෙවුම් තුලනය[1]

1978 දී ගෙවුම් තුලනය ප්‍රධාන වශයෙන් හැඩ ගැසුනේ 1977 දී ඇති කරන ලද ආර්ථික ප්‍රතිපත්ති සංශෝධනවල බලපෑමෙනි. මෙම ප්‍රතිපත්තිවලින් ගෙවුම් තුලනය කෙරෙහි වූ ක්ෂණික බලපෑම වූයේ 1977 දී ජංගම ගිණුමේ වූ රුපියල් දශ ලක්ෂ 1,266 ක (වි.හැ.අ. දශලක්ෂ 116 ක) අතිරික්තය 1978 දී රුපියල් දශලක්ෂ 782 ක (වි.හැ. අ. දශලක්ෂ 64 ක) හිඟයක් බවට පත්වීමය. එසේ වුවද, විදේශ වත්කම් 1978 දී තව දුරටත් ඉහළ ගිය අතර, වසර අවසානයේ දී වූ විදේශ වත්කම් මට්ටම 1979 වර්ෂය සඳහා අපේක්ෂිත ආනයන වලින් මාස 4 ක ආනයන වියදම් ගෙවීමට ප්‍රමාණවත් විය. වර්ෂය තුළදී විශාල ලෙස ලැබුණ දිගු කාලීන ප්‍රාග්ධනය හා ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලැබුණු ආධාර හේතු කොට ගෙන ප්‍රාග්ධන ගිණුමේ ඇති වූ අතිරික්තය විදේශ වත්කම් මෙලෙස වර්ධනය වීමට හේතු විය.

විනිමය හා වෙළඳ සීමාවන් ලිහිල් කිරීමේ බලපෑම ගෙවුම් තුලනය කෙරෙහි කැපී පෙනෙන ලෙස දක්නට ලැබුනේ විශේෂයෙන් ආනයන සම්බන්ධයෙනි. ආනයන වියදම 1977 දී රුපියල් දශලක්ෂ 6,290 (වි.හැ.අ. දශලක්ෂ 622) සිට 1978 දී රුපියල් දශලක්ෂ 15 350 (වි.හැ.අ. දශලක්ෂ 808) දක්වා වැඩි වූ අතර වි.හැ.අ.[2] අනුව බලන කල මෙම වැඩිවීම සියයට 30 ක් විය. කාලයක් තිස්සේ පාලන සීමා යටතේ අවහිරව පැවති ඉල්ලුම නිදහස් කිරීම මෙම ආනයන වැඩිවීමෙන් පිළිබිඹු විය. ආනයන වර්ධනය කෙරෙහි ආයෝජන සහ අතරමැදි භාණ්ඩ ප්‍රධාන වශයෙන් හේතු වූ අතර පරිභෝජන භාණ්ඩ ආනයන ඊට වඩා අඩුවේගයකින් වැඩි විය. 1978 දී ප්‍රාග්ධන භාණ්ඩ ආනයන දෙගුණයකටත් වඩා වැඩිවීම, එක් අතකින් අවුරුදු ගණනක් තිස්සේ දේශීය කර්මාන්තයන්හි පැවති අවහිරතාවයන් පිළිබිඹු

---

1. ගෙවුම් තුලනයෙහි යොදගෙන ඇති වෙළඳ දත්තයන්ගෙන් දක්වෙන්නේ වර්ෂය තුළ සිදුවූ ලැබීම හා ගෙවීමය. මෙම දත්තයන් අපනයන හා ආනයනයන්ගේ ද්‍රව්‍යමය චලනය නිරූපනය කරන මීට ඉහත දක් වූ විදේශීය වෙළඳ දත්තයන්ගෙන් වෙනස්වේ. එම වෙනසට හේතුව නම් එක් අතෙකින් ලැබීම හා ගෙවීම ද අනිත් අතින් භාණ්ඩයන්ගේ ද්‍රව්‍යමය චලනය ද අතර පවත්නා වෙනසයි.

2. ශ්‍රී ලංකාවේ විනිමය අනුපාතිකයේ නිතර ඇතිවූ වෙනස්කම් හා 1977 න් පසුව ප්‍රධාන ජාත්‍යන්තර මුදල් වර්ග අතර පැවති විනිමය අනුපාතිකවල අස්ථායිතාවයන් නිසා ගෙවුම් තුලනය සම්බන්ධ කාල ශ්‍රේණි දත්තයන් සංසන්දනය කිරීම අසීරු කරුණක් විය. ස්ථායි මූල්‍ය ඒකකයක් නොමැතිවීම නිසා සංසන් දනාත්මක කාර්යයන් සඳහා ගිණුම් ඒකකයක් ලෙස විශේෂ හැරගැනීමේ අයිතීන් (වි හැ.අ) මෙහිදී යොද ඇත.